සැ. යු.- මෙවර පළවන ගැසට් පත්‍රයේ V කොටස යටතේ 2010 වර්ෂයේ ජනවාරි සිට මාර්තු දක්වා කාර්තුවට අදාළව මුද්‍රණ ශිල්පීන්ගේ හා ප්‍රකාශකයින්ගේ ආඥාපනත යටතේ ලියාපදිංචි වූ පොත් නාමාවලියක් ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් පළවේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,806 - 2013 අප්‍රේල් මස 12 වැනි සිකුරාදා - 2013.04.12**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස : (IIඅ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු - ඇබෑර්තු ... ... ... ... | — | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 533 |

සැ. යු.- (i) රාජ්‍ය ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලය (සංශෝධන) පනත් කොටුම්පත, 2013 පෙබරවාරි මස 22 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II* වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(ii) අර්ල් ගුණසේකර පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත, 2013 පෙබරවාරි මස 22 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II* වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2013 මැයි මස 03 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2013 අප්‍රේල් මස 19 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති. (වැ. බ.).

2013 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.
*මෙම ගැසට් පත්‍රය www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,
(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,
(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,
(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**අධ්‍යාපන අමාත්‍යාංශය**

ජාතික පාසැල්වල පවතින ගුරු පුරප්පාඩු සඳහා ශ්‍රී ලංකා ගුරු සේවයට උපාධිධාරීන් බඳවා ගැනීම - 2013
(සිංහල, දෙමළ, ඉංග්‍රීසි මාධ්‍ය)

දිවයිනේ ජාතික පාසැල්වල පවතින ගුරු පුරප්පාඩු සඳහා ගුරු සේවා ව්‍යවස්ථාව ප්‍රකාරව ශ්‍රී ලංකා ගුරු සේවයේ 3-1 ශ්‍රේණියට බඳවා ගැනීම පිණිස උපාධිධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1. යෝග්‍යතා :-

1.1 *සාමාන්‍ය සුදුසුකම්.-*

i. ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුය.
ii. යහපත් චරිතයකින් සහ මනා මානසික හා ශාරීරික සෞඛ්‍යයෙන් යුක්ත විය යුතු ය.
iii. 2013.05.03 දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ වයස අවුරුදු 35ට නොවැඩි විය යුතු ය.

1.2 *අධ්‍යාපන සුදුසුකම් :*

i. ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථාව ප්‍රකාරව 2013.05.03 දිනට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක වලංගු හා අධ්‍යාපන අමාත්‍යාංශයේ නිර්ණිත විෂය ක්ෂේත්‍රයන්ගෙන් උපාධියක් ලබා තිබිය යුතුය. එම උපාධියට හදාරා ඇති ප්‍රධාන විෂයන්වලට අදාළ ගුරු පුරප්පාඩු සඳහා පමණක් ඉල්ලුම් කළ යුතු වේ.

ii. අධ්‍යාපන අමාත්‍යාංශය පිළිගත් ප්‍රතිපත්තිය මත අ.පො.ස. (සා.පෙළ) හා අ.පො.ස. (උසස් පෙළ) විභාගය පහත සඳහන් පරිදි සමත්ව තිබිය යුතු ය.

* අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය දෙවරකට නොවැඩි වාර ගණනක දී සම්මාන 3 ක් සහිතව මව්බස හා ගණිතය ද ඇතුළත්ව විෂයයන් 6 කින් එකවර සමත්වීම.
* අ.පො.ස. (උසස් පෙළ) විභාගයෙන් එක් වරක දී විෂයයන් 3 කින් සමත්වීම

සටහන - විභාග කොමසාරිස් ජනරාල් විසින් දේශීය අ.පො.ස. (සා.පෙළ) හා අ.පො.ස. (උසස් පෙළ) විභාග හා සමානව පිළිගනු ලබන විභාග සමතුන්ට ද ඉල්ලුම් කළ හැකිය.

03. *බඳවා ගැනීමේ ක්‍රමය සහ සේවා කොන්දේසි :*

2.1 මෙම දැන්වීමට අදාළ ව ඉල්ලුම් කරන ලද අයදුම්කරුවන් වෙනුවෙන් සේවයට බඳවා ගැනීමේ පත්වීම් බලධරයා විසින් නියම කරනු ලබන පරිදි විභාග කොමසාරිස් ජනරාල් විසින් ඉදිරියේ දී පවත්වනු ලබන තරග විභාගයේ දී ඉහළ ලකුණු ලබා ගත් අපේක්ෂකයින් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

2.2 උක්ත තරග විභාගයෙන් ලබා ගන්නා ලකුණුවල එකතුව අනුව, ප්‍රමුඛතාව පදනම් කරගෙන, පවතින ගුරු පුරප්පාඩු සඳහා පත්වීම් ලබාදීමට සුදුස්සන් තෝරා ගනු ලැබේ.

2.3 පවතින පුරප්පාඩු සංඛ්‍යාවට වඩා අඩු අයදුම්පත් සංඛ්‍යාවක් යම් විෂයයක් සඳහා ලැබී ඇත්නම් එම විෂයයට අදාළව තරග විභාගයක් නොපැවැත්වෙන අතර, සම්මුඛ පරීක්ෂණයක් මගින් පමණක් අයදුම්කරුවන් තෝරා ගනු ලැබේ.

2.4 රජයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලට ද, ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ පනවා ඇති කොන්දේසිවලට ද, එම ව්‍යවස්ථාවට කර ඇති හෝ මින් මතුවට කෙරෙන හෝ සංශෝධනවලට ද යටත්ව තෝරා ගනු ලබන අපේක්ෂකයින් ශ්‍රී ලංකා ගුරු සේවයේ 3-1 ශ්‍රේණියට පත් කරනු ලැබේ. මෙම තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය (2007.08.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 6/2006 (iv) අනුව රු. 14,135 - 180 x 9 -240 x 6 - 330 x 5 - 400 x 7 - 645 x 13 රු 30,030 ක් වේ. රු. 15,755 න් වන ඔබ්බට යාම සඳහා 2 වන පන්තියේ II ශ්‍රේණියට උසස්වීම ද, රු. 18,515 න් ඔබ්බට යාම සඳහා 2 වැනි පන්තියේ 1 වැනි ශ්‍රේණියට උසස්වීම් ද රු. 21,245 ඔබ්බට යාම සඳහා 1 වැනි පන්තියට උසස් වීම් ද ලබා ගත යුතුය. ඔබ මෙම වැටුප් පරිමාණයේ 8 වැනි පියවර වන රු. 15,395 ක මාසික වැටුප මත පිහිටුවනු ලැබේ.

2.5 මෙම පත්වීම් ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.

2.6 උසස්වීම් ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ විධිවිධාන යටතේ සිදු කරනු ඇත.

2.7 උපාධියට හාදාරා ඇති ප්‍රධාන විෂයයන් යටතේ පමණක් අයදුම් කළ යුතු අතර පත්වීම් විෂයය කිසිදු හේතුවක් නිසා වෙනස් කරනු නොලැබේ.

03. *අයදුම් කිරීමේ ක්‍රමය :*

3.1 අයදුම් පත්‍රය මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතු අතර ඒ 4 ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්ත භාවිත කරමින් සකස් කර අපේක්ෂකයා විසින්ම පිරවිය යුතු ය. 1.0 සිට 3.5 තෙක් වන ශීර්ෂ පළමුවන පිටුවේ ද, 4.0 සිට 7.0 තෙක් දෙවන පිටුවේ ද වන පරිදි තම අයදුම් පත්‍රය සකස් කළ යුතු බව විශේෂයෙන් සැලකිය යුතු ය. ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන අයැදුම්පත්‍ර ද අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයැදුම්පත්‍ර ද දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. (අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකිය) සම්පූර්ණ කරනු ලබන අයදුම් පත්‍රය විභාග නිවේදනයේ දැක්වෙන අයැදුම්පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු වේ. එසේ නොවුනහොත් අයදුම්පත ප්‍රතික්ෂේප විය හැකිය.

3.2 අයදුම් කරනු ලබන විෂයය කිසිසේත් වෙනස් කරනු නොලබන අතර ඒ පිළිබඳව ඉදිරිපත් කරන අභියාචනා පිළිබඳව සැළකිලිමත් නොවේ. එසේම එක් අපේක්ෂකයෙකුට ඉදිරිපත් කළ හැක්කේ එක් අයදුම්පතක් පමණි.

3.3 අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක, විදුහල්පතිවරයකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරී බලයලත් නිලධාරියෙකු, පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරන නිලධාරියෙකු හෝ රු. 240,360 කට වැඩි මූලික වාර්ෂික වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු හෝ විසින් සහතික කරනු ලැබ තිබිය යුතුය.

3.4 නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම් පත්‍ර 2013.05.03 දිනට හෝ ඊට පෙර "විභාග කොමසාරිස් ජනරාල්", සංවිධාන හා විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව පැලවත්ත, බත්තරමුල්ල" යන ලිපිනයට ලැබෙන පරිදි ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහා එවනු ලබන කවරයේ

වම්පස ඉහළ කෙළවරේ "ජාතික පාසල්වල පවතින ගුරු පුරප්පාඩු සඳහා ශ්‍රී ලංකා ගුරු සේවයට උපාධිධාරීන් බඳවා ගැනීම - 2013 (සිංහල, දෙමළ, ඉංග්‍රීසි මාධ්‍ය)" ලෙස අනිවාර්යයෙන් ම සඳහන් කළ යුතු ය.

3.5 සෑම ආකාරයකින්ම සම්පූර්ණ නොවන අයැදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපැල් කිරීමේ දී අයැදුම් පත්‍රයක් නැතිවීම හෝ ප්‍රමාද වීම හෝ ගැන කිසිම පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ.

3.6 අයැදුම්පත් ලැබී ඇති බව දන්වනු නොලැබේ. අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 2 ක් හෝ 3 ක් හෝ ගතවූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුයි. ඔබ වෙත තබා ගත් අයැදුම්පත්‍රයේ හා මුදල් ගෙවූ කුවිතාන්සියේ සහතික කළ ඡායා පිටපත් ද ලියාපදිංචි කළ කුවිතාන්සිය ද කොළඹින් බැහැර ප්‍රදේශයක නම් ප්‍රවේශ පත්‍රය එවීම සඳහා ෆැක්ස් අංකයක් ද සඳහන් ඔබගේ ඉල්ලීම් ලිපිය ෆැක්ස් මගින් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දැන්වීම වඩාත් ඵලදායී වනු ඇත.

04. *විභාගයට ඇතුළුවීම :—*

4.1 අයැදුම්පත් ලැබී ඇති සියලු ම පුද්ගලයන්ට විභාග කොමසාරිස් ජනරාල් විසින් ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. විභාගයට පෙනී සිටින අපේක්ෂකයෙකු විභාග මධ්‍යස්ථානයේ ශාලාධිපති වෙත තම අත්සන සහතික කරන ලද ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතුය. එසේ ඉදිරිපත් නොකරන අපේක්ෂකයෙකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

4.2 අපේක්ෂකයෙකු තමාට නියම කර ඇති විභාගශාලාවේ දී විභාගයට පෙනී සිටිය යුතුය. සෑම අපේක්ෂකයෙකු ම නියමිත විභාග ශාලාවට අදාළ ප්‍රවේශ පත්‍රය අත්සන සහතික කරවාගෙන පළමුවෙන් ම එම ශාලාවේ පෙනී සිටින දින එහි ශාලාධිපති වෙත භාර දිය යුතුය. සෑම අපේක්ෂකයෙකුම අනුගමනය කළ යුතු නීති මාලාවක් මෙම *ගැසට් පත්‍රයේ* වෙනම ම පළ කර ඇත. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කළ හොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට හෝ සිදුවනු ඇත.

සටහන - අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය හෝ විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ.

5. *අපේක්ෂකයින්ගේ අනන්‍යතාව .—* තමා පෙනී සිටින සෑම විෂයක් සම්බන්ධයෙන් ම විභාග ශාලාධිපති සෑහීමකට පත් වන අයුරින් අපේක්ෂකයෙකු විභාග ශාලාවේ දී තම අනන්‍යතාව ඔප්පු කර සිටිය යුතුය. මේ සඳහා පහත සඳහන් ඕනෑම ලේඛනයක් පමණක් පිළිගනු ඇත.

(අ) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කළ ජාතික හැඳුනුම්පත

(ආ) වලංගු විදේශ ගමන් බලපත්‍රයක්.

6. *සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම් :—*

6.1 අපේක්ෂකයෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට කලින් හෝ විභාගය පවත්වන කාලයකදී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. අපේක්ෂකයෙකු ඉදිරිපත් කර ඇති කිසියම් කරුණක් සාවද්‍ය බව හෙළි වුවහොත්, එසේ නැතිනම් යම් වැදගත් කරුණක් ඔහු/ඇය ඕනෑකමකින් යටපත් කර ඇත්නම් ඔහු/ඇය රජයේ සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත.

7. *විභාග ක්‍රමය හා විභාග මාධ්‍යය :—*

7.1 මෙම විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයෙන් කොළඹ දී පමණක් පවත්වනු ලැබේ.

7.2 ඉංග්‍රීසි මාධ්‍ය විෂයය පුරප්පාඩු සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවන් ඉංග්‍රීසි මාධ්‍යයෙන් පමණක් විභාගයට පෙනී සිටිය යුතු අතර, සිංහල හා දෙමළ මාධ්‍යය විෂයය පුරප්පාඩු සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවන් මව් භාෂාවෙන් විභාගයට පෙනී සිටිය යුතු ය.

8 *විෂය නිර්දේශය :—* මෙම විභාගයට නියමිත ප්‍රශ්න පත්‍ර සංඛ්‍යාව දෙකකි. එම ප්‍රශ්න පත්‍ර දෙක ම පහත සඳහන් පරිදි බහුවරණ හා කෙටි පිළිතුරු අපේක්ෂිත ප්‍රශ්නවලින් සමන්විත වේ. සියලුම අයැදුම්කරුවන් මෙම ප්‍රශ්න පත්‍ර සඳහා පෙනී සිටීම අනිවාර්ය වේ.

01 අභියෝග්‍යතාව - කාලය පැය 01 1/2 යි (ලකුණු 100 යි)

අපේක්ෂකයා සතු ගුරු වෘත්තිය සඳහා වන කුසලතා සහ තර්කානුකූල බුද්ධිය, තීරණ ගැනීමේ හැකියාව මැන බැලීම අරමුණු කොට ගෙන මෙම ප්‍රශ්න පත්‍රය සකසනු ලැබේ. මෙය බහුවරණ හා කෙටි පිළිතුරු මාදිලියේ ප්‍රශ්න 60 කින් සමන්විතය. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුයි.

02. සාමාන්‍ය දැනුම - කාලය පැය 01 1/2 යි (ලකුණු 100 යි)

ආර්ථික දේශපාලන අධ්‍යාපන සංස්කෘතික විද්‍යාත්මක හා ක්‍රීඩා ක්ෂේත්‍රයන්හි දේශීය හා විදේශීය වශයෙන් වැදගත් වන්නා වූ කාලීන සිද්ධීන් පිළිබඳව අපේක්ෂකයාගේ දැනුම මැනීම සඳහා සකස් කරන බහුවරණ හා කෙටි පිළිතුරු සැපයීමේ මාදිලියේ ප්‍රශ්න 75 කින් සමන්විත ප්‍රශ්න පත්‍රයකි. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු ය.

9. *විභාග ගාස්තු .—* විභාග ගාස්තුව රු. 500 කි. ආදායම් ශීර්ෂ අංක 2003.02.13 යටතේ විභාග කොමසාරිස් ජනරාල් නමින් ඕනෑම දිස්ත්‍රික්/ප්‍රාදේශීය ලේකම් කාර්යලයකට මුදල් ගෙවා අයැදුම්කරුගේම නමට ලබා ගන්නා ලදුපත අයැදුම්පත්‍රයේ නියමිත තීරුවේ අලවා එම ලදුපත් අංකය සඳහන් කරන්න. (ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත)

10. *අයැදුම්පත පිරවීම සඳහා උපදෙස් .—* අයැදුම්පත පිරවීමේදී පහත උපලේඛනය අනුව විෂයය හා විෂයයට අදාල සංකේත අංකය සඳහන් කරන්න. ඒ අනුව උපාධිය සඳහා හදාරන ලද ප්‍රධාන විෂයය හෝ විෂයයන්ට අදාළව පමණක් ඉල්ලුම් කළ හැකිය.

උපලේඛනය 01

| විභාගයට පෙනී සිටින මාධ්‍යය | අංකය |
|---|---|
| සිංහල | 02 |
| දෙමළ | 03 |
| ඉංග්‍රීසි | 04 |

උපලේඛනය 02

| විෂයය | පුරප්පාඩු සංඛ්‍යාව | විෂයයට අදාළ සංකේත අංකය |
|---|---|---|
| භූගෝල විද්‍යාව (සිංහල මාධ්‍ය) | 22 | 11 |
| භූගෝල විද්‍යාව (දෙමළ මාධ්‍ය) | 13 | 12 |
| භූගෝල විද්‍යාව (ඉංග්‍රීසි මාධ්‍ය) | 20 | 13 |
| ඉතිහාසය (සිංහල මාධ්‍ය) | 40 | 21 |
| ඉතිහාසය (දෙමළ මාධ්‍ය) | 14 | 22 |
| තර්ක ශාස්ත්‍රය (සිංහල මාධ්‍ය) | 33 | 31 |
| තර්ක ශාස්ත්‍රය (දෙමළ මාධ්‍ය) | 16 | 32 |
| චිත්‍ර (සිංහල මාධ්‍ය) | 14 | 41 |
| චිත්‍ර (දෙමළ මාධ්‍ය) | 13 | 42 |
| නාට්‍ය හා රංගකලාව (සිංහල මාධ්‍ය) | 22 | 51 |
| නාට්‍ය හා රංගකලාව (දෙමළ මාධ්‍ය) | 4 | 52 |
| ගෘහ ආර්ථික විද්‍යාව (සිංහල මාධ්‍ය) | 23 | 61 |
| ගෘහ ආර්ථික විද්‍යාව (දෙමළ මාධ්‍ය) | 7 | 62 |
| තොරතුරු තාක්ෂණය (සිංහල මාධ්‍ය) | 13 | 71 |
| තොරතුරු තාක්ෂණය (දෙමළ මාධ්‍ය) | 18 | 72 |
| තොරතුරු තාක්ෂණය (ඉංග්‍රීසි මාධ්‍ය) | 24 | 73 |
| ආර්ථික විද්‍යාව (සිංහල මාධ්‍ය) | 29 | 81 |
| ආර්ථික විද්‍යාව (දෙමළ මාධ්‍ය) | 19 | 82 |
| ආර්ථික විද්‍යාව (ඉංග්‍රීසි මාධ්‍ය) | 18 | 83 |
| ව්‍යාපාර අධ්‍යයනය (සිංහල මාධ්‍ය) | 30 | 91 |
| ව්‍යාපාර අධ්‍යයනය (දෙමළ මාධ්‍ය) | 6 | 92 |
| ව්‍යාපාර අධ්‍යයනය (ඉංග්‍රීසි මාධ්‍ය) | 18 | 93 |
| ගණකාධිකරණය (සිංහල මාධ්‍ය) | 31 | 111 |
| ගණකාධිකරණය (දෙමළ මාධ්‍ය) | 19 | 112 |
| ගණකාධිකරණය (ඉංග්‍රීසි මාධ්‍ය) | 29 | 113 |
| භෞතික විද්‍යාව (සිංහල මාධ්‍ය) | 48 | 121 |
| භෞතික විද්‍යාව (දෙමළ මාධ්‍ය) | 32 | 122 |
| භෞතික විද්‍යාව (ඉංග්‍රීසි මාධ්‍ය) | 16 | 123 |
| රසායන විද්‍යාව (සිංහල මාධ්‍ය) | 26 | 131 |
| රසායන විද්‍යාව (දෙමළ මාධ්‍ය) | 32 | 132 |
| රසායන විද්‍යාව (ඉංග්‍රීසි මාධ්‍ය) | 22 | 133 |
| ජීව විද්‍යාව (සිංහල මාධ්‍ය) | 15 | 141 |
| ජීව විද්‍යාව (දෙමළ මාධ්‍ය) | 18 | 142 |
| ජීව විද්‍යාව (ඉංග්‍රීසි මාධ්‍ය) | 21 | 143 |
| සංයුක්ත ගණිතය (සිංහල මාධ්‍ය) | 11 | 151 |
| සංයුක්ත ගණිතය (දෙමළ මාධ්‍ය) | 26 | 152 |
| සංයුක්ත ගණිතය (ඉංග්‍රීසි මාධ්‍ය) | 15 | 153 |
| කෘෂි විද්‍යාව (සිංහල මාධ්‍ය) | 24 | 161 |
| කෘෂි විද්‍යාව (දෙමළ මාධ්‍ය) | 15 | 162 |
| ඉංග්‍රීසි | 34 | 171 |

11. දැනට රජයේ සේවයේ සිටින නිලධාරීන් අයදුම්පත්‍රයේ අංක 07 ශීර්ෂය යටතේ තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් සහතික කරන ලද අයදුම්පත ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ.

12. සම්මුඛ පරීක්ෂණ සඳහා නියමිත දිනයේදී සහභාගී නොවන අයැදුම්කරුවන් පිළිබඳව පසුව කිසිදු අයුරකින් නැවත සලකා බලනු නොලැබේ.

13. එමෙන්ම සම්මුඛ පරීක්ෂණ දිනයට පසුව ඉදිරිපත් කරනු ලබන කිසිදු සහතිකයක් බාරගනු නොලැබේ.

14. මෙම නිවේදනයේ ආවරණය නොවන කිසියම් කාරණයක් වෙතොත් ඒ පිළිබඳව තීරණය කිරීමේ අයිතිය ද කිසියම් පුරප්පාඩුවලින් කොටසක් හෝ මුළුමනින්ම පිරවීම හෝ නොපිරවීම හෝ පිළිබඳව අවසන් තීරණය ගැනීමේ අයිතිය ද අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා සතුය.

එච්. එම්. ගෝඨාභය ජයරත්න,
ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය.

*ආදර්ශ අයදුම් පත්‍රය*

[ ]
කාර්යාලීය ප්‍රයෝජනය සඳහා

අධ්‍යාපන අමාත්‍යාංශය

*ජාතික පාසල්වල පවතින ගුරු පුරප්පාඩු සඳහා ශ්‍රී ලංකා ගුරු සේවයට උපාධිධාරීන් බඳවා ගැනීම - 2013 (සිංහල, දෙමළ, ඉංග්‍රීසි මාධ්‍ය)*

විභාගයට පෙනී සිටින මාධ්‍යය   මාධ්‍ය අංකය [ ]   සිංහල 02
දෙමළ 03
ඉංග්‍රීසි 04

(නිවේදනයේ 10 ඡේදය උපලේඛන 01 අනුව අදාළ අංකය කොටුව තුළ ලියන්න

| විෂයය | විෂයයට අදාළ සංකේත අංකය |
|---|---|
| | |
| | |
| | |

(නිවේදනයේ උපලේඛනය 2 අනුව අදාළ අංක කොටුව තුළ ලියන්න)

01. 1.1 මුලකුරු අගට යොදා මුලකුරු සමග නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) (උදා :PERERA A.. B.) :——————.

1.2 මුලකුරුවලින් දැක්වෙන නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :——————.

02. වර්තමාන ලිපිනය :- (ඉංග්‍රීසි කැපිටල් අකුරින්):——————.
(ප්‍රවේශපත්‍ර මෙම ලිපිනයට තැපැල් කරනු ලැබේ)

03. 3.1 ස්ත්‍රී/පුරුෂ භාවය (ස්ත්‍රී -1 පුරුෂ -0) [ ]
(අදාළ අංකය කොටුව තුළ ලියන්න) :

3.2 විවාහක/අවිවාහක බව : අවිවාහක -1 විවාහක - 2 [ ]
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

3.3 උපන් දිනය: වර්ෂය: | | | | | මාසය: | | | දිනය: | | |

3.4 2013.05.03 දිනට වයස : අවු: | | | මාස: | | | දින: | | |

3.5 ජාතික හැඳුනුම්පත් අංකය: | | | | | | | | | | |

04. උසස් අධ්‍යාපන සුදුසුකම් පිළිබඳව විස්තර :

4.1 උපාධිය:————————.

4.2 නිකුත් කළ විශ්ව විද්‍යාලය:————————.

4.3 උපාධිය වලංගු දිනය:————————.

4.4 උපාධියට හදාරා ඇති ප්‍රධාන විෂයය/විෂයයන්:—————.

4.5 උපාධිය ලබා ඇති මාධ්‍යය:————————.

05 5.1 ගෙවා ඇති විභාග ගාස්තුව රුපියල් ፡ (අකුරින්):——————.

5.2 කුවිතාන්සියේ අංකය:————————.

5.3 නිකුත් කළ කාර්යාලය:————————.

5.4 දිනය:————————.

කුවිතාන්සියේ ඡායා පිටපතක් ඔබ වෙත තබා ගන්න.
මුදල් කුවිතාන්සිය නොගැලවෙන සේ මෙහි අලවන්න.

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය බව ප්‍රකාශ කරමි. මා මෙම තනතුරට තෝරාගනු ලැබීමෙන් පසුව නුසුදුසු බව අනාවරණය වුවහොත් මා සේවයෙන් පහ කිරීමට යටත්වන බව මම දනිමි. තවද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත්වන බව ද ප්‍රකාශ කරමි. මෙහි සඳහන් කිසිම තොරතුරක් පසුව වෙනස් නොකරමි.

————————,
අයැදුම්කරුගේ අත්සන.

දිනය :————————.

04-479

*6.0 අයැදුම්කරුගේ අත්සන සහතික කිරීම :*

මෙම අයැදුම්පත ඉදිරිපත් කරනු ලබන.......................................... මහතා/මහත්මිය/මෙනවිය මා පෞද්ගලිකව හඳුනන බව ද ඔහු/ඇය මා ඉදිරිපිටදී ................................ දින ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බව ද, නියමිත විභාග ගාස්තු ගෙවා ඇති බව ද, එම ලදුපත අලවා ඇති බව ද, සහතික කරමි.

————————,
අත්සන සහතික කරන
නිලධාරියාගේ අත්සන.

දිනය:————————.

සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම:————————.
තනතුර:————————.
ලිපිනය:————————.

*7.0 අයැදුම්කරු රජයේ සේවකයෙකු නම් දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය*

————————.මහතා/මහත්මිය/මෙනවියගේ ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කරමි. ඔහු/ඇය මෙම අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ ස්ථිර/තාවකාලික/අනියම් සේවයෙකු/සේවිකාවක වශයෙන් සේවය කරන බවත් මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැකි/නොහැකි බවත් දන්වමි.

————————,
දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ
බලය පවරනු ලැබූ නිලධාරියා.

දිනය:————————.
තනතුර:————————.
අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව:————————.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.